# තනතුරු ඇබෑර්තු

## ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය - අනුරාධපුරය

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් 2024.08.13 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

## ආරක්ෂක පරීක්ෂක II ශ්‍රේණිය

**සුදුසුකම්**

1) අ) අපොස (සාමාන්‍ය පෙළ) විභාගය දෙවරකට නොඅඩු වාර ගණනකදී පහත විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 6ක් සමගින් සමත් වී තිබිය යුතුයි.

   i. සිංහල භාෂාව/දෙමළ භාෂාව හෝ සාහිත්‍යය

   ii. අංක ගණිතය, වාණිජ්‍යය ගණිතය/ඉංග්‍රීසි සාහිත්‍යය

**හෝ**

   ආ) උසස් අධ්‍යාපන ආයතනයක අවම වශයෙන් වසර 05ක සතුටුදායක සේවා කාලයක් සේවය කර තිබීම සහ උක්ත විෂයන් සඳහා සම්මාන සාමාර්ථ සහිතව නෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය විෂයයන් 06ක් සහිතව සමත් වී තිබීම.

**සහ**

2) පොලිසියේ හෝ සන්නද්ධ සේවයේ වසර 05ක සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම හෝ විශ්වවිද්‍යාල හෝ උසස් අධ්‍යාපන ආයතනයක ආරක්ෂක අංශයේ හෝ පිළිගත හැකි ආරක්ෂක සංවිධානයක වසර 05 ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

3) ක්‍රීඩා සඳහා ක්‍රියාකාරීව සහභාගී වී තිබීම අනිවාර්ය වේ.

4) උස – අවම වශයෙන් අඩි 5 අඟල් 6 විය යුතුයි.

   පපුව – අවම වශයෙන් අඟල් 34 ක් විය යුතුයි. (සාමාන්‍යය)

5) වයස – අවුරුදු 40 ට නොවැඩි විය යුතුයි.

**යෝග්‍යතාව**

(අ) ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුයි.

(ආ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු හා 40ට නොවැඩි පිරිමි පුද්ගලයෙකු විය යුතුයි.

(ඇ) යහපත් චරිතයකින් යුක්ත විය යුතුයි.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය** - සම්මුඛ පරීක්ෂණයක් මගින් වේ.

**වැටුප් පරිමාණය** - U-MN1(III) රු. 30,725-17X300-35,825 p.m. (විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 (V) අනුව

**ප්‍රතිලාභ**

- වැටුප්වලට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.
- විශ්වවිද්‍යාල සේවයට බඳවාගනු ලබන අයට විශ්වවිද්‍යාලය මගින් පවත්වාගෙන යනු ලබන සේවක අර්ථ සාධක අරමුදලේ සාමාජිකත්වය ලැබේ. (අර්ථසාධක අරමුදල සඳහා නිලධාරියාගේ වැටුපෙන් 10% ක මුදලක් සහ විශ්වවිද්‍යාලය මගින් 15% ක මුදලක් බැර කෙරේ.) සේවක භාරකාර අරමුදලට 3% ක මුදලක් විශ්වවිද්‍යාලය මගින් බැර කරනු ලැබේ.

**අයදුම්පත්**

සෙ.මී. 23X10 ප්‍රමාණයේ ලිපිනය සහිත, මුද්දර ඇලවූ ලියුම් කවරයක් සහකාර ලේඛකාධිකාරී (ආයතන) වෙත 2024.08.03 දින හෝ ඊට පෙර එවීමෙන් තනතුරට අදාළ අයදුම්පත් හා විස්තර ලබාගත හැකි අතර, **www.busl.ac.lk** වෙබ් අඩවියෙන් ද බාගත කරගත හැකිය.

**අයදුම්කරන පිළිවෙළ**

i. සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඊට අදාළ සහතිකවල පිටපත් සමග ලියාපදිංචි තැපෑලෙන් **සහකාර ලේඛකාධිකාරී (ආයතන) ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, පුත්තලම පාර, අනුරාධපුරය** යන ලිපිනයට 2024.08.13 දින හෝ ඊට පෙර එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

ii. විශ්වවිද්‍යාල/ රජයේ දෙපාර්තමේන්තු/ සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතනවල සේවයේ නියුතු අය තම අයදුම්පත් අදාළ ආයතන/ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

iii. නියමිත ආකෘතියෙන් ඉදිරිපත්කර නොමැති, අසම්පූර්ණ හා අයදුම්පත් භාරගන්නා දිනයට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

iv. සුදුසුකම්ලත් අපේක්ෂකයින් පමණක් කෙටි ලැයිස්තු ගතකර සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතු වේ.

**ලේඛකාධිකාරී,**
**ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය,**
**2024.07.14**